**මහාචාර්ය කපිල අභයවංස**

**තායිලන්තයේ
ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයේ
උපකුලපති**



# බුදුදහම රාජ්‍ය ආගම විය යුතුද?

නව ව්‍යවස්ථාවක් යෝජනා වෙමින් පවතින මේ අවදියෙහි බුදුදහමට එහි කවර තැනක් හිමි වේද යන්න පිළිබඳව නිතර සාකච්ඡා වනු දක්නට ලැබේ. පවත්නා ව්‍යවස්ථාවෙහි බුදුදහමට හිමිව ඇති තත්වය වෙනස් නොවී ඒ අයුරින්ම පැවතිය යුතු බව බහුතරයකගේ මතය වී ඇත. ඇතමෙකුගේ මතය වී ඇත්තේ ව්‍යවස්ථාව තුළින්ම ලංකාව අනාගමික රාජ්‍යයක් වශයෙන් ප්‍රකාශයට පත්විය යුතු බවයි.

ව්‍යවස්ථාවෙහි බුදුදහමට හිමිව ඇති තැන වෙනස් නොකිරීමට බොහෝ දෙනෙකුගේ අදහස වී ඇත්තේ මන්දැයි විමසා බැලීම මෙහිදී වැදගත් වෙයි. බුදුදහමට ප්‍රමුඛත්වය දෙමින් බුද්ධශාසනය ආරක්‍ෂා කොට පොෂණය කිරීමට දැනට පවත්නා ව්‍යවස්ථාවෙන් ප්‍රතිඥාවක් දී තිබේ. මෙහිදී බුදුදහම (Buddhism) හා බුද්ධශාසනය යන පද දෙක වෙන වෙනම ව්‍යවස්ථාවෙහි සඳහන් වී තිබීම විමසා බැලිය යුත්තකි. මූලික අර්ථයෙන් ගත් කළ මේ දෙකින් ම අදහස් වන්නේ එක ම දෙයකි. බුදුදහමත් බුදුසසුනත් දෙකක් නොව එකෙකි. දෙකෙන් ම කියවෙන්නේ බුදුන් වහන්සේ ලෝවැස්සන්ගේ හිතසුව සඳහා ඉදිරිපත් කොට වදාළ ඉගැන්වීම් සමුදායයි. එහෙත් ව්‍යවස්ථාවෙහි සඳහන් වන්නේත් රටේ බහුතර ජනතාව අදහස් කරන්නේත් බුදුසසුන යනු බුදුදහමින් අන්‍ය වූ දෙයක් ලෙසය.

රාජ්‍ය ව්‍යවස්ථාවෙහි සඳහන් බුදුදහමට ප්‍රමුඛත්වයක් දීම යන්න පිළිබඳව රාජ්‍යය කරවන්නන් හෝ බෞද්ධයයි කියා ගන්නා රටේ බහුතර ජනතාව හෝ මෙතෙක් කිසිදු අවධානයක් යොමු කොට ඇති බවක් දක්නට නැත. ඒ හැම කෙනෙක් ම අවධානය යොමු කරන්නේ බුද්ධශාසනය ආරක්‍ෂා කොට පොෂණය කිරීම යන්න පිළිබඳව පමණි. ව්‍යවස්ථාවෙහි බුදුදහමට හිමිව ඇති තැන වෙනස් නොකළ යුතුයයි උද්ඝෝෂණය කරන්නන් මෙන් ම ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් විය යුතුයයි කියන ඊනියා විදග්ධ ජනතාව ද තම ස්ථාවරයන්හි පිහිටා ඇත්තේ බුද්ධශාසනය ආරක්‍ෂා කොට පොෂණය කිරීම යන්නට අවධානය යොමු කොට ඇති බැවිනි. කාලාන්තරයක් මුළුල්ලේ බුදුසසුන යන පදය ව්‍යවහාර වන්නේ බුදුදහමින් වෙනස් වූ දෙයක් ලෙසය. බුදුසසුන බුදුදහමට සමානත්වයෙන් සැලකෙන්නේ නම් එය පරියත්ති පටිපත්ති පටිවෙධ යන ත්‍රිවිධ ශාසනය තුළ අර්ථවත් වෙයි. එහෙත් වර්තමානයෙහි බුදුසසුන යන්න භාවිත වන්නේ එබඳු අර්ථයක් අරමුණු කරගෙන නොවේ. ඉහත කී ත්‍රිවිධ ශාසනයට සම්පූර්ණයෙන් ම පරිබාහිර වූ බෞද්ධ සංස්කෘතිය ලෙස අර්ථ ගැන්විය හැකි වැඳුම් පිදුම් සිරිත් විරිත් උත්සව විහාරාංග ආදිය ශාසනය යන්නට ඇතුළත් කරගෙන තිබේ. ඒ අනුව එබඳු අංගෝපාංගයන් සංවර්ධනය කිරීම හා පවත්වා ගැනීම ශාසනයේ පොෂණය හා ආරක්‍ෂාව ලෙස සැළකීමට බොහෝ දෙනා පුරුදු වී සිටිති.

ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවගෙන් අති බහුතරයක් ම බුදුසසුන ලෙස අවංකව ම පිළිගෙන ඇත්තේ නියම බුදුසසුන නමැති මාහැඟි අමෘත ඵලයේ පිට පොත්ත සේ සැළකිය හැකි බෞද්ධ සංස්කෘතික අංගොපාංග බවට කිසිදු සැකයක් නැත. ඒවායින් තොර බුදුසසුනක් ගැන සිතීමටවත් බොහෝ දෙනෙකුට හැකියාවක් නැත. එපමණක් නොව එබඳු බුදුසසුනක් කෙරෙහි මමායනය තුළින් දැඩිව එල්බ ගැනීමක් ද දක්නට ඇත. තමන් බෞද්ධයයි බොහෝ දෙනෙකු සිතා සිටින්නේ ද බුදුදහම කෙරෙහි නොව ඉහත කී බුදුසසුන කෙරෙහි දක්වන ඇල්ම නිසාය. රට රැකීම යනු සසුන රැකීම ලෙසත් සසුන රැකීම යනු රට රැකීම ලෙසත් ගැනෙන දුටුගැමුණු චින්තනය සිංහල බෞද්ධයන් තුළ මේ දක්වාමත් පැලපදියම්ව තිබේ. එබැවින් ඔවුනට අනුව ශාසනය ආරක්‍ෂා කොට පෝෂණය කිරීමට ව්‍යවස්ථාවෙහි ප්‍රමුඛත්වය හිමි විය යුතුය. ලංකාව අනාගමික රාජ්‍යයක් ලෙස පවත්වා ගැනීම ව්‍යවස්ථාවෙන් තහවුරු වියයුතුයයි ද බුදුසසුනට විශෙෂත්වයක් එහි හිමි නොවිය යුතුයයි ද සිතන්නන් එබඳු නිගමනයකට එළඹ ඇත්තේ ඇයිදැයි විමසා බැලීම ද මෙහිදී වැදගත් වෙයි. ඔවුනට ද බුදුසසුන යනු සිංහල බෞද්ධයන්ගේ බුදුසසුනට වඩා වෙනස් වූවක් නොවේ. එබඳු සසුනක පවත්නා අංගෝපාංග ඒ අයුරින් ම කතෝලික හින්දු හා ඉස්ලාම් යන ආගමිකයන් සතුව ද පවතියි. එසේ නම් බුදුසසුනට පමණක් ව්‍යවස්ථාවෙන් විශේෂත්වයක් පැවරීම අනෙක් ආගම් පහත් තත්වයට හෙලීමක් වනු ඇතැයි ද එමගින් ආගමික සහජීවනය හා සංහිඳියාව පළුදු වනු ඇතැයි ද ඔවුන් සිතනවා නොඅනුමානය.

**සැබවින් ම රාජ්‍යයක සියළු පුරවැසියන් සමානත්වයෙන් සළකා සැමගේ අයිතිවාසිකම් සපුරමින් ඔවුනට නිවැරදිව හිතසුව සැලසීම සඳහා මග පෙන්විය හැකි ප්‍රතිපත්ති මූලාශ්‍රයක් පැවතිය යුතුය. රාජ්‍යව්‍යවස්ථාවෙහි ප්‍රතිපත්ති සකස් විය යුත්තේ ඒ ප්‍රතිපත්ති මූලාශ්‍රයට අනුවය.**

ආගම්වල ඇදහිලි පුදපූජා සිරිත්විරිත් උත්සව ආදිය පමණක් ආගම වශයෙන් සැළකේ නම් ඒ ආගම් අතර වෙනස පවතින්නේ ඒ ඒ ආගමට විශේෂ වූ ලබ්ධියෙන්, ඒවා පවත්වන ආකාරයෙන් හා බලාපොරොත්තු වන අරමුණු අතින් පමණි. ප්‍රජාතන්ත්‍රවාදී රටක එබඳු ආගම් කිහිපයක් පවතින්නේ නම් එයින් එක් ආගමකට පමණක් විශේෂත්වයක් දැක්වීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මයන්ට පටහැනි වෙයි. ජාති ආගම් කුලමල නොසළකා සැමට පොදුවේ සමාන බවකින් සැළකීම ප්‍රජාතන්ත්‍රවාදයේදී අගය කෙරෙයි.

බුදුදහම යනු සැබවින් ම ඇදහිලි පුදපූජා සිරිත්විරිත් ඇදියට සීමා වූ ඊනියා බුදුසසුන නොවේ. ඒ වූ කලි පරියත්ති පටිපත්ති පටිවෙධ යනුවෙන් ගැනෙන ත්‍රිවිධ අංශයකින් සමන්විත වූ බුද්ධශාසනයයි. එහි පරියත්ති යනු බුදුන් වහන්සේ විසින් දෙසූ දහම් මගයි. එය පිළිපැදිය යුතු දහමකි. දහම අනුව පිළිපැදීම පටිපත්ති නම්. පිළිපැදීමෙන් ලබන අවබොධය පටිවෙධයයි කියනු ලැබේ.

පරියත්ති නමින් ගැනෙන බුදුන් වදාළ දහම කිසියම් එක්තරා පිරිසකට පමණක් අදාළ වන්නක් හෝ සීමා වන්නක් නොවේ. එය සමස්ත මානව වර්ගයාගේ ජීවිත සාර්ථකත්වයට පමුණුවාලිය හැකි ඉගැන්වීම් මාලාවකි. පුද්ගල ජීවිතය සාර්ථකත්වයට පත් කරලීමට අනිවාර්යයෙන් ම අදාළ වන අංශ කිහිපයක් බුදුදහමින් අවධාරණය වෙයි. පුද්ගල සදාචාරය, සමාජ සාරධර්ම, ආර්ථික සමෘද්ධිය හා ධාර්මික රාජ්‍යපාලනය යන අංශ එහි ලා ප්‍රමුඛත්වයට එයි.

අන්‍යොන්‍ය සුහදතාව පවත්වා ගතහැකි පරිදි දුසිරිතෙන් තොරවූ සදාචාරශීලී පැවැත්මකට අදාළ ප්‍රතිපත්ති සමුදායයක් පුද්ගල සදාචාරය යටතේ ඉදිරිපත් වෙයි. සමානාත්මතා ධර්මය පදනම් කොට ගත් සාමකාමී සමාජ පරිසරයක් නිර්මානය කළහැකි ප්‍රතිපත්ති මාලාවක් සමාජ සාරධර්ම යටතට ගැනෙයි. දිළිඳුබව දුරුකොට සුඛිත මුදිත ජීවන පැවැතමකට අදාළවන ආර්ථික ප්‍රතිපත්ති රැසක් ආර්ථික සමෘද්ධිය යටතේ දැක්වී ඇත. රටක ජනතාවක් තුළ පැවතිය යුතු ඉහත කී අංශ සියල්ල නියාමනය කළහැකි රාජ්‍යප්‍රතිපත්ති සමූහයක් ධාර්මික රාජ්‍යපාලනය යටතට අයත් වෙයි.

මේ කිසිදු අංශයක් බුදුදහමින් ඉදිරිපත් වන්නේ මිනිසුන් අතරෙහි කිසියම් විශෙෂ වූ ජාතියක්, ආගමක්, කුලයක් හෝ වර්ගයක් ඉලක්ක කොට ගෙන නොවේ. ඒවා පොදුවේ මුළු මහත් මානව සමාජයේ ම යහපත, සාමය, සහජීවනය හා සුවසෙත අරමුණු කොට ඇත. එබැවින් ඒවා ඕනෑ ම කෙනෙකුට තමාගේ ආගමෙහි, ලබ්ධියෙහි, ජාතියෙහි, කුලයෙහි හෝ වර්ගයෙහි රැඳී සිටිමින් ම ක්‍රියාත්මක කළ හැකිය. ඒවායේ ප්‍රතිලාභ ලැබෙන්නේ ද පොදු මානව සමාජයට මය.

කිසිදු වර්ග භේදයකින් තොරව මානව සමාජයේ ම සුබසෙත අරමුණු කෙරුණු ප්‍රතිපත්ති ගැබ් කොට ගත් මානව දහමක් තුළින් රාජ්‍යයක් නියාමනය වේ නම් කිසිවෙකුට එහි වරදක් දැකිය හැකිද? ඊට එරෙහි වීමට කිසිවකුට සාධාරණ හේතු යුක්ති තිබේද? ඇතැම් විට එම දහම හැඳින්වීමට "බුදු" යන උපපදය යෙදී ඇති බැවින් දහම ගැන කිසිත් නොදැන බෞද්ධ යන නමට ද්වෙෂ කරන්නකුට හැර අන්